
# ජාතික සංවර්ධනය
# සහ
# ලාංකීය ගුවන්විදුලිය



44

ආචාර්ය සේන නානායක්කාර

600/2
99493

# ජාතික සංවර්ධනය
# සහ
# ලාංකීය ගුවන්විදුලිය

## (ජනමාධ්‍ය පර්යේෂණ අධ්‍යයනය)

RAJMNLIB
99493

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**ආචාර්ය සේන නානායක්කාර**

B.A. (Hons.), M.A. (Research), Ph. D. (Mass Comm.)

අංශාධිපති
මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයය
මිහින්තලේ

| ප්‍රවේශ අංකය | 99493 |
| --- | --- |
| වර්ග අංකය | 302.2344 NAN. |

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

# පූර්විකාව

මානව සමාජ සංවර්ධනය තීරණය කෙරෙන ප්‍රධාන සාධක කිහිපයක් වෙයි. ඒවා සමාජයීය, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික ආදී වශයෙන් විවිධ වර්ගීකරණයන්ට භාජන කළ හැකි ය. සන්නිවේදනය වූ කලී ඒ සඳහා වන පසුබිම් ක්ෂේත්‍රය යි. ජනමාධ්‍ය හැඳින්වෙන්නේ එකී පසුබිම තුළ භාවිත කාරකයක් හෙවත් සන්නිවේදන ක්‍රියාකාරිත්වයක් වශයෙනි. එහිදී එක් ප්‍රධානතම මෙවලමක් ලෙස ගුවන්විදුලිය හඳුන්වා දිය හැකි ය.

එබැවින්, සංවර්ධනාත්මක සන්නිවේදනය ත්, ගුවන්විදුලිය මාධ්‍යය ත් එකිනෙකින් වියුක්ත නොවූ විෂය ක්ෂේත්‍ර ද්වයක් ලෙස නිර්වචනය කිරීම අතිශයෝක්තියක් නොවේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධන ක්‍රියාවලියෙහි ලා ගුවන්විදුලිය මාධ්‍යයෙහි සන්නිවේදනමය දායකත්වය විමසීම තුළ නිර්වචනීය විසංවාදයක් පැන නො නැඟේ. එය විශ්වසනීයත්වයකින් යුතු, පූර්ණ අධ්‍යයන ප්‍රස්තාවන් සහිත ශීර්ෂයක් ලෙස පිළිගැනීමට වෙනත් සාධක අවශ්‍ය නොවේ.

ජාතික සංවර්ධන ක්‍රියාවලිය හා ලාංකීය ගුවන්විදුලි මාධ්‍යය පිළිබඳ තුලනාත්මක හැදෑරීමකදී එහි ඵලදායකත්වය සම්බන්ධයෙන් එතරම් තෘප්තිමත් කූට ප්‍රාප්තියක් දක්නට නොවේ. වෙසෙස් ශක්‍යතා බහුල, බලසම්පන්න මාධ්‍යයක් වුව එහි ලාංකීය අත්දැකීම එබඳු ය. සංවර්ධනයට කේන්ද්‍ර කොට ගැනෙන විෂය ක්ෂේත්‍රය හෝ ආයතනය ත්, මාධ්‍යය හා ප්‍රජාව ත් අතර සක්‍රිය විය යුතු අඛණ්ඩ අන්තර් සබඳතාවක් නිර්මාණය වී

නො තිබීම මීට හේතු වන බව මගේ විශ්වාසය යි. ලාංකීය ගුවන්විදුලි ඉතිහාසයේ බොහෝ සංවර්ධන වැඩසටහන් ඵලදායී ප්‍රායෝගික භාවිතාවන් නොවූ හුදු ව්‍යාජයන් මෙන් ම නිෂ්ඵල වූ හුදෙකලා ගුවන් කාලයන් බවට පත්වූයේ එබැවිනැ යි මම හඟිමි.

මෙහිදී මා විසින් හඳුන්වා දෙනු ලබන නව IMC අඛණ්ඩ අන්තර් සම්බන්ධතා ක්‍රමවේදය ඒ සඳහා වන ප්‍රායෝගික පිළියම කි. අන්තර් ආයතනික වශයෙන් සපුරාගත යුතු ව්‍යූහාත්මක ක්‍රියාකාරිත්වයක් මෙහිදී අත්‍යවශ්‍ය වෙයි. එය මාධ්‍ය හා ප්‍රජාව අතර ද තහවුරු වූ කල දිගුකාලීන ව ලැබිය හැකි ඵලදායකත්වය අනුපමේය වනු නිසැක ය. මෙකී පර්යේෂණ අධ්‍යයනය ලාංකීය සමාජ සංවර්ධන ක්‍රියාවලියෙහි ලා අත්‍යවශ්‍ය වූ ත්, කාලෝචිත වූ ත්, ඌන පූරණයක් ලෙස සැලකෙන්නේ ද එබැවිනි. ඒ නිසා ම මෙය, අප අත්විඳිමින් සිටින අද්‍යතන සමාජ වටපිටාව තුළ කුළුගැන්වෙන දුෂ්කර ව්‍යායාමයක් ලෙස ද නම් කළ හැකි ය.

එබඳු අතිශය වැදගත් වූ ත්, දුෂ්කර නමුත් කාලෝචිත වූ ත් ශාස්ත්‍රීය ප්‍රයත්නයක්, අවසන මගේ ආචාර්ය උපාධි පර්යේෂණ නිබන්ධය බවට පත්විය. මේ එහි සංශෝධිත අඩකිනුත් අඩක් පමණි. මෙකී කාර්යය කෙරෙහි ප්‍රථම වරට මා පොළඹවාලුයේ කැලණිය විශ්වවිද්‍යාලයීය ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයෝ වෙති. මගේ සරල අවධානය ගැඹුරු ශාස්ත්‍රීය ප්‍රතිෂ්ඨාවක් කරා ප්‍රවිෂ්ට කැරවූයේ එතුමන් ය. එතුමන් වෙතින් ලද සදුපදේශ මග පෙන්වීම් මෙකී අධ්‍යයනයෙහි ලා වූ ප්‍රතිබල සම්පන්න ආශිර්වාදයක් ම වූ බව ගුරු බැති හර සර පෙරදැරි ව ප්‍රථමයෙන් සඳහමි.

ඒ සමග ම මෙකී නිබන්ධයෙහි ලා දුලබ හරවත් නිමාවක් දකින්නට මා මෙහෙයවූවන් අතර ජනසන්නිවේදන අධ්‍යයන අංශාධිපති මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ සුධීමත් හු ද ප්‍රමුඛ වෙති. විවිධ සමාජ විචල්‍යතා හා හැලහැප්පීම් මැද මා දිරිමත් කරමින් මෙහි අප්‍රමාද නිමාවක අවශ්‍යතාව පහදා දුන් එතුමන් නොසිටින්නට අද මෙය ලත් තැන ම ලොප් වූ නිෂ්ඵල වෑයමක් වනු නිසැක ය. එතුමන් ට ද පිං දෙමි.

මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු, මහාචාර්ය ඩබ්. එස්. කරුණාතිලක, මහාචාර්ය සෝමරත්න බාලසූරිය, මහාචාර්ය දයා

එදිරිසිංහ යනාදී වියත් පඬිවරුන් වෙතින් නිබඳ මා ලද සදුපදේශ මුසු ආශිර්වාදය, මෙය පිරිපුන් හැදෑරීමක් බවට පෙරළන්නට ශක්තියක් විය. ආචාර්ය රෝහණ ලක්ෂමන් පියදාස හා ආචාර්ය එච්. ඩබ්. කරුණාරත්නයන් ද ඒ අතර වෙති. ආචාර්ය ආරියරත්න ඇතුගල, ආචාර්ය මාපා තිලකරත්න, ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර යන සහෝදරවරු න්ගෙන් හා ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ සෙසු සියලු කථිකාචාර්යවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ද, කොළඹ විශ්වවිද්‍යාලයීය ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අංශ ප්‍රධානී ආචාර්ය ටියුඩර් වීරසිංහයන්ගෙන් ද ලද විවිධ සහායයන් මෙකී කාර්යයෙහි ලා සැපැයුණු සවිමත් අත්වැලක් විය.

දත්ත හා තොරතුරු එක් රැස්කිරීමේ ක්‍රමවේදයක් ලෙස භාවිත කළ ආයතනික ඇසුර විසින් මා වෙත සමීප කරන ලද සහෘදයින් ගණනින් විශාල ය. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රධාන මධ්‍යස්ථානය ත්, රජරට සේවාව ත් ඒ අතර ප්‍රධාන වෙයි. සිංහල සේවා අධ්‍යක්ෂ ගාමිණී විජේවර්ධන සොයුරා ඇතුළු කාර්යමණ්ඩලය ත්, රජරට සේවා පාලකවරුන් වන තෙන්නකෝන් ඉහළගම සොයුරා හා ශ්‍රියාණි සමරනායක සොයුරිය ඇතුළු කාර්යමණ්ඩලය ත්, මහ ඉලුප්පල්ලම මහවැලි ප්‍රජා ගුවන්විදුලි පාලක ව සිටි දයානන්ද ලියනගම සොයුරා ත් මෙහිදී සිහිපත් කළ යුතු ම ය. ජාතික ලේඛනාගාරයේ හා ජාතික කෞතුකාගාර පුස්තකාලයේ කාර්යමණ්ඩල සහෘදයන් වෙතින් ලද සහාය අනල්ප ය. කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ශිරෝමිකා මාදම්පගේ සොයුරිය ත්, දුර්ලභ අංශයේ රණසිංහ සොයුරා ත් කෘතගුණ පූර්වක ව සමරමි.

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය මානවශාස්ත්‍ර අධ්‍යයන අංශයේ කථිකාචාර්ය නිශාන්ත ඇලෝසියස් සොයුරා හා කාර්යමණ්ඩලයේ සියලු දෙනා ත්, පරිගණක තාක්ෂණ අංශ ප්‍රධානී පී. ඩී. විමලසිරි, නිශාන්ත වීරකෝන්, වී. කේ. නිමල් ගාමිණී හා මෙකී නිබන්ධය පරිගණක අක්ෂරකරණයෙහි ලා කාලය ත්, ශ්‍රමය ත් සොඳුරු සහෘදත්වය ත් නොමසුරු ව ප්‍රදානය කළ පී. එස්. පල්ලියගුරුගේ යන සොයුරන් ඇතුළු ජයන්ත, කමල්, ලලිතා, ලක්ෂිකා හා ශශිකලා යන සොයුරු සොයුරියනුත් ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී අශෝකා සිරිවර්ධන

සොයුරිය හා කාර්යමණ්ඩලය ද, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ හිටපු භාෂා පරිවර්තක වෛද්‍ය එස්. ටී. ද එස් ගුණවර්ධන මහත්මාණන් හා කෑගල්ල යට්ටෝගොඩ ඒ. ජයසේකර ආරච්චි සහෘදයා ද පුණ්‍යානුමෝදනාවෙන් යුතු ව සිහිපත් කළ යුතු ම ය. ඒ මිනිස්කම් අද අප අතර සුලබ නැත. ඔවුනට ස්තුති වේවා.....!

මා දිවි ගමන අතිශයින් දුෂ්කර වූවකි. පුද්ගල සුඛ විහරණය බොහෝවිට මගේ ජීවිතයෙන් ඈත් වූවක් වෙයි. ඒ සියල්ල මා විසින් ම අරමුණක් ලෙස සංවිධාන කොට ගත්තක් යැයි මට සිතේ. එනිසා ම මගේ ජීවිතයේ කුඩු මහත් සකලවිධ සිදුවීම් අරබයා නිස්සරණාධ්‍යාශයෙන් පරිත්‍යාගශීලී කැපකිරීම් කරන්නෝ දුලබ නොවන්නා හ. මෙකී ශාස්ත්‍රීය වෑයමෙහි අභිප්‍රේතාර්ථ සාධනයෙහි ලා කැපකිරීම් කළ එබඳු සත්පුරුෂයෝ තවත් කිහිප දෙනෙකි.

කැලණිය පොල්හේන ශාන්ත්‍යාරාම විහාරාධිපති අමරපුර මූලවංශ මහා නිකායේ ප්‍රධාන අධිකරණ සංඝනායක පූජ්‍ය ගැවිලිපිටියේ පඤ්ඤාරංසි තිස්ස නායක හිමිපාණන්වහන්සේ එහි ප්‍රමුඛ වෙති. පුරා දෙවසරක් තිස්සේ යෙදුණු ඒ දුෂ්කර කාර්යයෙහි සංකීර්ණතාව මඳකට හෝ අවම කරවන ලද්දේ ඒ උත්තරීතර සංඝ පීතෘවරයාණන්වහන්සේ තුළ පැවතියා වූ පරෝපකාරී දානමය චින්තාව විසිනැයි මම හඟිමි. සමාජ සංවර්ධනයෙහි ලා බෞද්ධ දාර්ශනික චින්තාව විමසීමේදී එබඳු වියත්පත් ධර්මධර බුදුපුතුන් වහන්සේ නමකගේ සදාශ්‍රය මහඟුතම අත්වැලක් වන බව මෙහිදී පසක් කෙරිණි. නායක හිමිපාණන්වහන්සේ ත්, පූජ්‍ය ගන්තුනේ සෝමතිලක හිමියන් හා පූජ්‍ය ගැවිලිපිටියේ රතනරංසි හිමියන් ප්‍රමුඛ සද්ධිවිහාරික මහ සඟ ගණ නිබඳ මගේ නමස්කාර පූර්වක වන්දනයට ලක්වෙති.

මේ කාර්යයෙහි මුල සිට අග දක්වා මගේ සමීපතමයින් වූ චන්ද්‍රසේන රංගොඩ, එස්. චින්තක, කැලුම් නිශාන්ත, රුවන් චාමර, නුඹන් සම්පත්, චන්ද්‍රසිරි, චමින්ද රණවක, රවීන්ද්‍ර කුමාර, නිමල් කේ. පියදාස, විජේදාස රත්නායක හා සරත් සුනිමල් ඇතුළු පිරිස සහෝදරත්වයෙන් සමරමි. සහෘදයිනේ........, නුඹලා මට සැබෑ ශක්තියක් වූ අයුරු!

ආදරණීය සුද්දී......! මේ දුෂ්කර කාල පරිච්ඡේදය තුළ වැඩියෙන් ම දුක් ගැහැට අනුභව කරන්නී ඔබ ම ය. ඔබ මැණියන් හා පවුලේ සැමට මා පින් පැතිය යුතු ම ය. මා බිරිඳ ඔබ නොවූවා නම්, මෙය හුදෙක් දිවා කල මා දකින්නා වූ සිහිනයක් ම වනු නො අනුමාන ය.

එ පමණක් නොව, මා ගෙදර එන තුරු ප්‍රාර්ථනා කන්දක් ළඟ අතරමං ව දැවුරුද්දක් දෑස් දල්වා බලා සිටි ප්‍රාණසම මගේ ආදරණීය අම්මේ......., මේ දුෂ්කර ප්‍රයත්නයෙහි බලසම්පන්නතම උත්තේජනය වූයේ ඔබේ ඒ මහඟු ප්‍රාර්ථනය ම ය. එය එසේ වුව, එකී ප්‍රාර්ථනය යථාර්ථයක් වනු දකින්නට ඔබ අද අප අතර නැත. ඉතින්..., ඔබේ උත්තරීතර නාමයට ත්, සෙසු සියලුදෙනාට ත් මගේ හෘදයංගම කෘතවේදී ගෞරවය සපිරි සෙනෙහස ද මෙසේ පිරිනමන්නෙමි. සියලුදෙනාට ස්තුති වේවා...!

සේන නානායක්කාර

# පටුන


| | | |
|---|---|---|
| | පිළිගැන්වීම | v |
| | පූර්විකාව | vi |
| 1. | සංවර්ධනාත්මක සන්නිවේදන කාර්යයෙහි ලා ගුවන්විදුලිය මාධ්‍යයේ ශක්‍යතාව සහ ලංකා ගුවන්විදුලියේ සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය (1924 - 1935) | 15 |
| 1.1. | හැඳින්වීම: | 15 |
| 1.2. | සංවර්ධනාත්මක සන්නිවේදන කාර්යයෙහි ලා ගුවන්විදුලිය මාධ්‍යය සතු ශක්‍යතා | 17 |
| 1.3. | ලංකා ගුවන්විදුලියේ සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය (1924 - 1935) | 36 |
| 2. | 1936 සිට ව්‍යවස්ථාපිත සංස්ථාවක් දක්වා සංවර්ධනාත්මක සන්නිවේදන ක්‍රියාවලිය | 71 |
| 2.1. | හැඳින්වීම | 71 |
| 2.2. | ප්‍රවෘත්ති සන්නිවේදනය | 72 |
| 2.3. | කෘෂිකාර්මික සන්නිවේදනය හා සංවර්ධනාත්මක වැඩසටහන් | 81 |
| 2.4. | අධ්‍යාපනික සන්නිවේදනය සහ සංවර්ධනය (1936-1966) | 124 |
| 2.5. | බෞද්ධාගමික සන්නිවේදනය හා සමාජ සංවර්ධනය | 143 |

| | | |
|---|---|---|
| 3. | ගුවන්විදුලි නාට්‍යය, සංගීතය හා 1967 න් පසු සංවර්ධනාත්මක සන්නිවේදනය | 150 |
| 3.1. | ගුවන්විදුලි නාට්‍යය හා සංවර්ධනාත්මක සන්නිවේදනය | 150 |
| 3.2. | සංගීතය, රසඥතාවර්ධනය හා සංවර්ධන සංකල්පය | 179 |
| 3.3. | පසුකාලීන සංවර්ධන අරමුණු හා ගුවන්විදුලි වැඩසටහන් (1967 න් පසු) | 204 |
| 4. | රජරට ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවේ සංවර්ධනාත්මක සන්නිවේදන කාර්යභාරය | 242 |
| 4.1. | හැඳින්වීම. | 242 |
| 4.2. | ප්‍රාදේශීය සේවාවන් බිහිවීමේ ඓතිහාසික පසුබිම, උපයෝගිතාව හා රජරටසේවාවේ සමාරම්භය | 243 |
| 4.3. | රජරටසේවයේ සංවර්ධනාත්මක සන්නිවේදන කාර්යභාරය | 255 |
| 4.4. | නව - IMC අඛණ්ඩ අන්තර් සම්බන්ධතා ක්‍රමවේදය | 305 |

උප ග්‍රන්ථය 1- රජරටසේවා සංරක්ෂිත වැඩසටහන්

උප ග්‍රන්ථය 2- ඡායාරූපාවලිය

උප ග්‍රන්ථය 3- උප ලේඛනාවලිය